**රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට එරෙහිව පනවා තිබූ වාරණය විසුරුවා හරිමින් හා අතුරු තහනම් ආඥාව ප්‍රතික්ෂේප කරමින් ගල්කිස්ස දිසා අධිකරණයේ අංක 1337/14/විශේෂ නඩු විභාගයේදී ගරු විනිශ්චයකාරතුමා දී ඇති තීන්දු වල උධෘත කිහිපයක් උපුටා දක්වමු.**

**පිටු අංක 14**

සම්පූර්ණ ක්‍රියාදාමයේ දී පැමිණිලිකරුවන් ක්‍රියා කර ඇති ආකාරය අනුව අධිකරණ කාර්යාවලිය පැමිණිලිකරුවන් විසින් අනිසි ලෙස යොදා ගෙන ඇති බව ද පෙනී යයි.

**පිටු අංක 16-17**

කෙසේ වෙතත්, විත්තිකරුවන් විසින් අංක: 1335/14/ විශේෂ දරණ නඩුවේ නිකුත් කර ඇති වාරණ ආඥාව බැලූ බැල්මටම උල්ලංඝනය කර

06 AUG 2014

ඇති බවට මෙතෙක් ඉදිරිපත් වී ඇති කරුණු අනුව අනුමිතියකට එළඹිය නොහැක. එසේ හෙයින්, එකී නිතිමය මූලධර්ම මෙම නඩුවේ විත්තිකරුවන් සම්බන්ධයෙන් යොදා ගත නොහැකි බවට ද තීරණය කරමි.

**පිටු අංක 17**

> අනෙක් අතට, 2014, 2015 වර්ෂ සඳහා රජයේ වෛද්‍ය නිලධරයන් සඳහා නිලවරණයක් නොපවත්වන ලෙසට අංක: 1335/14/විශේෂ දරණ නඩුවේ වාරණය කර තිබියදී එකී වාරණ ආඥාව යම් පාර්ශ්වයක් විසින් උල්ලංඝනය කළ පමණින් 2014, 2015 වර්ෂයන් සඳහා රජයේ වෛද්‍ය නිලධාරීන් සඳහා වූ නිලවරණය නීතිවිරෝධී, බලශූන්‍ය සහ/හෝ බලරහිත බවට අධිකරණයෙන් ප්‍රකාශයක් කළ නොහැක.

**පිටු අංක 17 /18**

> ඒ අනුව, මෙම අධිකරණයේ අංක: 1335/14/විශේෂ දරණ නඩුවෙන් නිකුත් කර ඇති වාරණ ආඥාව විත්තිකරුවන් විසින් උල්ලංඝනය කළේය යන පදනම මත 2014, 2015 වර්ෂ සඳහා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ පැවති නිලවරණය නීතිවිරෝධී බවට හෝ එකී නිලවරණයෙන් තේරී පත් වූ නිලධරයන්ට එකී නිලවරණයේ ප්‍රතිඵල භුක්ති විඳීමට නීත්‍යානුකූල හිමිකමක් නොමැති බවට ද තීරණය කළ නොහැක.
>
> 06 AUG 2014

**පිටු අංක 20**

> [illegible] ඒ අනුව, මුද්දර ගසා නොමැති දිවුරුම් ප්‍රකාශයක අන්තර්ගත සාක්ෂි නීතිය ඉදිරියේ පිළිගැනීමට ද නොහැක.

**පිටු අංක 21**

සියලු කරුණු අනුව බැලු බැල්මටම පෙනී යන නඩුවක් පැමිණිල්ල විසින් මෙම නඩුවේ ඉදිරිපත් කර නොමැති බවට ද තීරණය කරමි.

**පිටු අංක 23**

සියලු කරුණු අනුව, කොළඹ දිසා අධිකරණයේ පවතින අංකඃ ඩී.එස්.පි 138/2014 නඩුවේ සිද්ධිමය කරුණු මුල් කරගෙන අංකඃ 1335/2014 නඩුව සමග මෙම නඩුව පවරා ඇති හෙයින්, විත්තිකරුවන් අධිකරණ කාර්යාවලිය වැරදි ලෙස යොදා ගෙන ඇති බවද පෙනී යයි.

2, 12, 16 විත්තිකරුවන්ගේ පදිංචිය සාක්ෂි මත තීරණය කළ යුතු කරුණක් වුව ද, පැමිණිල්ලේම සිරස අනුව, මෙම නඩුවේ අධිකරණ බලය සම්බන්ධයෙන් සාධාරණ යුක්ති සහගත සැකයක් ද ඇත.

**පිටු අංක 25**

සඳහන් වැදගත් කරුණු වාරණ ආඥාව ලබා ගැනීමේ දී පැමිණිල්ල අධිකරණයට හෙළිදරව් කර නොමැත.

AUG 2014

මෙම නඩුවේ පැමිණිලිකරුවන් ද නිළවරණයට සහභාගි වී ඇති බවත්,

**පිටු අංක 27**

| |
|---|
| එවැනි තත්ත්වයක් යටතේ වාර්ෂික මහා සභා රැස්වීමකදී එවැනි අතුරු කොමිටියක් පත් කිරීමේ අවශ්‍යතාවයක් ද නැත. |

**පිටු අංක 28**

| |
|---|
| ඒ අනුව, පහසුකමේ සම්බන්ධතාවය සැලකුව ද වාරණ ආඥාව තවදුරටත් දීර්ඝ කිරීම සුදුසු නොවන බවට තීරණය කරමි.<br><br>ඉහත සඳහන් සියලු කරුණු සැලකීමේ දී 1 සිට 9 දක්වා සහ 13 සිට 16 දක්වා විත්තිකරුවන් හට විරෝධතා ප්‍රකාශයෙන් අයැද ඇති පරිදි මෙම නඩුවේ දැනටමත් නිකුත් කර ඇති වාරණ ආඥාව වහාම අත්හිටුවීමට සහ/හෝ විසුරුවා හැරීමට නියම කරමි. |

| |
|---|
| මෙම විමර්ශණයේ දි ඉදිරිපත් වු සියලු කරුණු අනුව, අතුරු තහනම් ආඥාවක් සඳහා වු පැමිණිලිකරුවන්ගේ ඉල්ලීම ද ප්‍රතික්ෂේප කරමි. මෙම නඩුවේ අතුරු තහනම් ආඥා නොතිසි නිකුත් කිරීමට ප්‍රමාණවත් කරුණු පැමිණිල්ල වෙනුවෙන් ඉදිරිපත් කර නොමැති හෙයින්, අතුරු තහනම් ආඥා නොතිසි ද ආපසු කැඳවමි. |

## පිටු අංක 33

ඒ අනුව, 10 වින්තිසරු වෙනුවෙන් නීතිඥ චතුරිකා විජේසිංහ පත් කරමින්, 10 වන වින්තිකාර සංගමයේ භාරකරුවන් ලෙස වෛද්‍ය ලලන්ත රණසිංහ සහ වෛද්‍ය බී.පී.එන් රත්නසේන විසින් ගොනු කර ඇති පෙරකලාසිය ද ප්‍රතික්ෂේප කරමි.

තවද මෙම නඩුවේ රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමයෙහි ව්‍යවස්ථාවේ 17(A)(G)(I) බලය ප්‍රකාරව මහා කොමිටිය විසින් රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමය වෙනුවෙන් නියෝජනය කර පෙරකලාසි ගොනු කර අධිකරණ කටයුතු කිරීම සඳහා වෛද්‍ය සමන් අබේවර්ධන, වෛද්‍ය පබා පලිහවඩන, වෛද්‍ය ප්‍රසන්න දසනායක යන අයට 2014.07.21 දිනැති ලිපියෙන් නියම කර ඇති හෙයින්, රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමය වෙනුවෙන් නීතිඥ, එස්.ඩී අරුල්ප්‍රකාශම් ගොනු කර ඇති පෙරකලාසිය නීතිය ඉදිරියේ පිළිගත හැකි වලංගු ලේඛනයක් බවට ද තීරණය කරමි.